# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1909/42 - 2015 අප්‍රේල් මස 08 වැනි බදාදා - 2015.04.08

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## ජනාධිපතිතුමාණන් විසින් කරන ලද ප්‍රකාශන ආදිය

ජනා.කා.අංකය : සීඑස්ජ්/7/සීඕඅයි/එම්එස්/01.

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමන් විසිනි**

මුද්‍රාව

මෛත්‍රීපාල සිරිසේන

1. කුලතුංග මුදියන්සේලාගේ ගිහාන් හිමාන්ශු කුලතුංග මැතිතුමා
   මහාධිකරණ විනිශ්චයකාර

2. සරත් චන්ද්‍රසිරි මායාදුන්නේ මැතිතුමා
   විශ්‍රාමික විගණකාධිපති

3. ජනාධිපති නීතිඥ අයියතුරෙයි ඥානදාසන් මැතිතුමා
   විශ්‍රාමික අතිරේක සොලිසිටර් ජනරාල්

වෙත,

ශුභාශිංසන පූර්වකවයි !

පරීක්ෂණ කොමිෂන් සභා පනතෙහි (393 වන අධිකාරය) 2 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව වර්ෂ 2015 මාර්තු මස 03 වැනි දිනැති අධිකාරී පත්‍රය මගින් මවිසින් පරීක්ෂණ කොමිෂන් සභාවක් පිහිටුවා ඇති හෙයින්ද,

තවද, එකී පරීක්ෂණ කොමිෂන් සභාවෙහි කොමසාරිස්වරයෙකු හා සභාපති වන ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාර ජනාධිපති නීතිඥ ගරු වැවගේ ප්‍රියසාද් ජෙරාඩ් ඩෙප් මැතිතුමා සහ කොමසාරිස්වරයෙකු වන ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාර ගරු අනිල් ගුණරත්න මැතිතුමා සිය ධූරවලින් ඉල්ලා අස්වී ඇති හෙයින් ද,

තවද, එමගින් ඇතිවූ පුරප්පාඩු පිරවීමේ අවශ්‍යතාවය හඳුනාගනු ලැබ ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන වන මම, පරීක්ෂණ කොමිෂන් සභා පනතේ 3 වන වගන්තියේ විධිවිධානයන්ට අනුකූලව මහාධිකරණ විනිසුරුවරුන් වන ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා සහ දේගිරි අමේන්ද්‍ර මෙන්ඩිස්


1A - G 21292 — 10 (2015/04)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

සෙනෙවිරත්න මැතිතුමා, එතුමන්ලාගේ විචක්ෂණභාවය, සාමාර්ථය හා විශ්වාසවන්තභාවය කෙරෙහි මහත්වූ භක්තිය හා විශ්වාසය තබමින්, ඉහත කී අධිකාරී පත්‍රය ප්‍රකාර ස්ථාපනය කරනු ලැබූ පරීක්ෂණ කොමිෂන් සභාවේ කොමසාරිස්වරුන් ලෙස මෙයින් පත් කරමි.

තවද, එකී පරීක්ෂණ කොමිෂන් සභාවේ සභාපතිවරයා වශයෙන් ඉහත කී මහාධිකරණයේ විනිශ්චයකාර ප්‍රීති පද්මන් සූරසේන මැතිතුමා පත් කරමි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුද්‍රාව යටතේ වර්ෂ දෙදහස් පහළොවක් වූ අප්‍රේල් මස 02 වන දින වූ මෙදින කොළඹ දී දෙන ලදී.

අතිගරු ජනාධිපතිතුමාගේ අණ පරිදි,

පී. බී. අබේකෝන්,
ජනාධිපති ලේකම්.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.